# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,346 - 2023 අගෝස්තු මස 18 වැනි සිකුරාදා - 2023.08.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 500 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 සැප්තැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මොනරාගල දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

*මොනරාගල දිසා අධිකරණයේ,*

*නඩු අංකය* : DR/78/2019
*ඇස්කීසි අංක* : 03/2023
*වටිනාකම* : රු. 2,397,541

සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්,
අංක 155/A, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08
(කලින් දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්
යනුවෙන් නම්කර හඳුන්වනු ලැබූ)
(සමාගම් අංක පී.බී. 3795)

*ශාඛා කාර්යාලය :*

මැදගම, බිබිල පාරේ, බස් නැවතුම අසල යන ලිපිනයේ එහි
පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් පිහිටි,
සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්,
(කලින් මොරටුව, රාවතාවත්ත පාර, අංක 45, අර්ථධර්ම කේන්ද්‍රය)

................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. අබ්දුල් කපූර් මොහමඩ් නලීම් *හෙවත්* අබ්දුල් කෆූර් මොහමඩ් නලීම්,
   අංක 10, කනුව මැදගම.

2. අබ්දුල් මජිඩ් නසරුල්ලා,
   අංක 10, කණුව මැදගම.

......................*විත්තිකරු.*

වර්ෂ 2019ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින මොනරාගල දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පැමිණිලිකරු සහ 01 වන විත්තිකරු අතර රුපියල් 3,070,696/-ක මුදලක් සඳහා ඇති වූ සමථය ප්‍රකාර ව 01 වැනි විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ගෙවීම පැහැර හැර ඇති බැවින් 01 වැනි විත්තිකරු විසින් එකී සමථයට යටත් ව නියත කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය ප්‍රකාර ව 01 වැනි විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවා ඇති රුපියල් 427,000/- ක මුදල අඩු කර ඉතිරි මුදල වන රුපියල් 2,643,696/-ක මුදල හා ඇස්කිසි වියදම් ද පැමිණිලිකාර සමාගමට 01 වැනි විත්තිකරුගෙන් අයකර දීම සඳහා මා විසින් වර්ෂ **2023ක් වූ පෙබරවාරි මස 02 වැනි දින** තහනමට ගන්නා ලද 01 වැනි විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2023 සැප්තැම්බර් මස 04 වැනි දින ප. ව. 1.30ට** එම නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

ඉහත කී පළමුවන උකස්කරු හට වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින මැදගම පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සරත් බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද අංක 73 දරන විකුණුම්කර ඔප්පුව මත සහ අයිති ව, නිරවුල් ව, අඛණ්ඩ ව භුක්ති විඳගෙන එනු ලබන,

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම් පත්තු කෝරළේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කලින් වෙල්ලස්ස කොටසේ) බකිනිගහවෙල ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ බකිනිගහවෙල ගමේ පිහිටි ''වෙලගෙදර වත්ත'' නැමති ඉඩම බිබිලේ පදිංචි බලයලත් මානක එස්. පී. රත්නායක විසින් මැන සාදන වර්ෂ 1991 දෙසැම්බර් මස 13 වැනි දින මැන සකස් කරන ලද අංක M/134 දරන සැලැස්මේ කැබලි අංක 03 වශයෙන් නිරූපිත බිම් කොටසට මායිම් :

උතුරට : එකී පිඹුරේ ලොට් අංක 02 ද,
නැගෙනහිරට : ගොරක්ගහ කඳුර ද,

දකුණට : එකී පිඹුරේ ලොට් අංක 04 ද,
බස්නාහිරට : මැදගම මොනරාගල යන ප්‍රසිද්ධ පාර ද,

යන මෙකී හතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දෙකක් (රූඩ්. 1, පර්. 2) ඉඩම නැවත මැන වර්ෂ 2016.02.05 වැනි දින අවසරලත් මානක පී. ඩබ්ලිව්. නන්දසේන විසින් මැන සකස් කරන ලද අංක 6402 දරන සැලැස්මේ කැබලි අංක 01න් නිරූපිත බිම් කොටසට එකී පිඹුර ප්‍රකාර ව මායිම් :

උතුරට : අවසරලත් මානක එස්. පී. රත්නායකගේ අංක එම්. 134 දරන සැලැස්මේ කැබලි අංක 02 ද,
නැගෙනහිරට : ගොරක්ගහ කඳුර ද,
දකුණට : අවසරලත් මානක එස්. පී. රත්නායකගේ අංක එම්. 134 දරන සැලැස්මේ කැබලි අංක 04 ද,
බස්නාහිරට : මැදගම මොනරාගල යන ප්‍රසිද්ධ පාර ද,

යන මෙකී හතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් දෙකක් (රූ. 1, පර්. 2) විශාලත්වය ඇති බිම් කොටස සහ ඊට අයත් සෑම සියලු දේත් සමග එකී ඉඩමට පිවිසීමේ සියලු පොදු ප්‍රවේශ මාර්ග අයිතීන් ද සමග වේ.

බී. ඩබ්. දයාරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මොනරාගල.

වර්ෂ 2023ක් වූ ජූලි මස 27 වැනි දින දී ය.

08-867

---

## පුත්තලම දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

**අංක 126/MB දරන නඩුවට අදාළව පුත්තලම දිසා අධිකරණයේ ඇ/අංක 20/2023 යටතේ පිස්කල් මගින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, කල්පිටිය කෝරළේ, අක්කරෙයි පත්තු උතුරු පත්තුවේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, කන්දකුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, කන්දකුලිය නමැති ගමේ පිහිටි, මුක්කු විට්ටඩි තෝට්ටම් නමැති ඉඩමට, මායිම් :

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද,
නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද,
දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද,
බස්නාහිරට : අයිරාංගනීගේ ඉඩම ද,

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම පහක් (පර්. 19.5) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 117/264 හි ලියාපදිංචි වී ඇත.
ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.
ඉහත කී කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කන්දකුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, කන්දකුලිය නමැති ගමේ පිහිටි, මුක්කු වට්ටඩි තෝට්ටම් නමැති ඉඩමට, එම්. එච්. සබාර් බලයලත් මානක තැන විසින් 2015.07.08 වැනි දින මැන බෙදා වෙන් කර සාදන ලද අංක 3460 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටස මායිම් :

උතුරට : අයිරාංගනීට අයිති ඉඩම සහ ප්‍රාදේශීය සභා පාර ද,
නැගෙනහිරට : කේ. ඒ. කාන්තිලතා යන අයට අයිති ඉඩම සහ එස්. එච්. නිහාල් ප්‍රනාන්දු යන අයට අයිති ඉඩම ද,
දකුණට : එස්. ටී. එන්. පීරිස් යන අයට අයිති ඉඩම ද,
බස්නාහිරට : අයිරාංගනීගේ ඉඩම ද,

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම හතක (පර්. 18.7) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

ඉඩමේ ප්‍රමාණය : පර්ඃ 18.7

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 117/264 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම* : කොළඹ පුත්තලම ප්‍රධාන මාර්ගයේ පාලවිය හන්දියෙන් වම්පසට ඇති කල්පිටිය මාර්ගයේ කි. මී. 37ක් පමණ යන විට හමුවන කුරිඤ්ඤම්පිටිය හන්දියෙන් වමට හැරී කි. මී. 04ක් පමණ යනවිට ජල ටැංකිය පාර හමුවේ. එම පාරේ මී. 200ක් පමණ ඉදිරියට යනවිට මාර්ගයේ වම්පසින් වෙන්දේසි කිරීමට නියමිත දේපළ පිහිටා ඇත.

**නියෝජ්‍ය පිස්කල් විසින් 2023 සැප්තැම්බර් මස 22 වැනි දින ප.ව 2.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.**

අදාළ දේපළ විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

**ගෙවීමේ ක්‍රමය :**

වෙන්දේසිය අවසානයේ මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල,
4. සියලුම ප්‍රචාරක ගාස්තු,
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු වේ.

ඉහත සඳහන් කල පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් තැන්පත් කළ මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබාගත හැක. දුරකථන 032 2253300, 032 2253301 ෆැක්ස් 032 2255247

රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
පුත්තලම.

08 - 974

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.